**ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුනි 16 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදන හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 6,063.74 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉන් රු. මිලියන 3,876.14 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් රු.මිලියන 2,187.60 ක් හෙවත් සියයට 36.08 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 369.80 | 363.81 | 5.99 | 1.62 |
| මූලධන | 5,693.94 | 3,512.33 | 2,181.61 | 38.31 |
| **එකතුව** | **6,063.74** | **3,876.14** | **2,187.60** | **36.08** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 23 ක් හා දෙපාර්තමේන්තු 18 ක් විසින් එකතුව රු.මිලියන 1,308.98 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු අතර එම ප්‍රතිපාදනවලින් රු. මිලියන 1,144.58 ක් උපයෝජනය කර තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 27501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 25.00 | 25.01 | 16.50 | 18.84 | 120.00 | 83.45 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තැන්පත් ගිණුම් 07 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 259.33 ක් විය. විස්තර පහත දැක්වේ.

| පොදු තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0116/000 | 1.99 |
| 6000/0000/00/0002/0164/000 | 11.05 |
| 6000/0000/00/0013/0118/000 | 55.57 |
| 6000/0000/00/0016/0108/000 | 189.11 |
| 6000/0000/00/0017/0030/000 | 0.96 |
| 6000/0000/00/0018/0108/000 | 0.54 |
| 6000/0000/00/0019/0026/000 | 0.11 |
| **එකතුව** | **259.33** |

## 2.4 විගණන නිරීක්ෂණය

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන

වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 3 ඡේදයේ දක්වා ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 ක් විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ඇලහැර හා මැදිරිගිරිය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් යාවත්කාලීනව කර පවත්වා නොතිබුණි. |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/ 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |
| (ඇ) | මුදල් පොත/සුළු මුදල් පොත | මුදල් රෙගුලාසි 446 | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මුදල් පොත් පවත්වා නොතිබුණු අතර, ලංකාපුර, ඇලහැර හා වැලිකන්ද යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සුළු මුදල් පොත් පවත්වා නොතිබුණි. |
| (ඈ) | තොග පොත | මුදල් රෙගුලාසි 751 | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |
| (ඉ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | ලංකාපුර, හිඟුරක්ගොඩ, මැදි රිගිරිය, ඇලහැර හා වැලිකන්ද යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| (ඊ) | හානි ලේඛනය | මුදල් රෙගුලාසි 110 | ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි |
| (උ) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | මැදිරිගිරිය, දිඹුලාගල හා ඇලහැර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | තමන්කඩුව, ලංකාපුර,මැදිරිගිරියදිඹුලාගල හා ඇලහැර ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| (එ) | ලංසු කැදවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | මැදිරිගිරිය හා ඇලහැර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |

**3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

---------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 12 කට 2017 මැයි 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර එම විමසුම්වලට අදාළ ගණනය කළහැකි ගනුදෙනුවල වටිනාකම රු.721,414,721 ක් වී තිබුණි.

**3.3 විසර්ජන ගිණුම**

---------------

**3.3.1 අයවැය විචලනය**

------------------

වැය විෂයන් 05 කට අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 28 ක සිට සියයට 52 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන**

-----------------------------------------------------------------

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 23 ක් හා දෙපාර්තමේන්තු 18 ක් විසින් එකතුව රු.මිලියන 1,308.98 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු අතර, එම ප්‍රතිපාදනවලින් රු. මිලියන 1,144.58 ක් උපයෝජනය කර තිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

-----------------------

වසර 02 ක් ඉක්මවූ රු. 650,269 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

-----------------------------------------------------------------

විෂය අංක 27501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 කට අයත් මියගිය හා විශ්‍රාමගිය නිලධාරීන් 15 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂයන්ගේ එකතුව රු.2,139,467 ක් වූ අතර එම ණය ශේෂ පරිවර්තිත විශ්‍රාම වැටුප්වලින් හෝ පාරිතෝෂික මුදලින් හෝ නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක වැඩ තහනම් කර තිබුණු නිලධාරීන් දෙදෙනෙකුගෙන් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක සේවය අතහැර ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් වර්ෂ 1 ක සිට වර්ෂ 16 ත් අතර කාල පරාසයක සිට පැවත

එමින් තිබුණු රු. 1,304,643 ක හිඟහිටි ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගැනීමට අපොහොසත් වී තිබුණි.

### 3.6 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

### 3.6.1 අභ්‍යන්තර විගණනය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මකව පවතින නමුත් එමගින් රු. මිලියන 6,663.44 ක් වූ ප්‍රාග්ධන වියදම් පරීක්ෂාවට ලක්කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

### 3.7 වත්කම් කළමනාකරණය

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවතුණි.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති කාලය | |
|---|---|---|---|---|
| | | | වර්ෂ 03 කට අඩු | වර්ෂ 03 කට වැඩි |
| (i) | ප්‍රාදේශීය ලේකම් නිල නිවස - ලංකාපුර | 01 | 01 | - |
| (ii) | රජයේ නිවාස - හිඟුරක්ගොඩ | 02 | - | 02 |
| (iii) | ප්‍රින්ටර් | 16 | 16 | - |
| (iv) | C.D.M.A .දුරකථන | 13 | - | 13 |
| (v) | තැපැල් මුද්‍රා යන්ත්‍ර | 01 | 01 | - |
| (vi) | රෝනියෝ යන්ත්‍ර | 01 | - | 01 |
| (vii) | භාවිතයට ගත නොහැකි පරිගණක | 03 | 03 | - |
| (viii) | පරිගණක මොනිටර් | 19 | 19 | - |
| (ix) | UPS | 30 | 30 | - |
| (x) | CPU | 24 | 09 | 15 |
| (xi) | ඡායා පිටපත් යන්ත්‍ර | 04 | 04 | - |
| (xii) | රුධිර පීඩන පරීක්ෂා කිරීමේ යන්ත්‍ර | 01 | - | 01 |
| (xiii) | වායු සමීකරණ යන්ත්‍ර | 01 | - | 01 |
| (xiv) | ලීටර් 500 ජල පිරිපහදු කරන යන්ත්‍ර | 02 | - | 02 |
| (xv) | ඩුප්ලෝ මැෂින් | 01 | 01 | - |
| (xvi) | ෆැක්ස් යන්ත්‍ර | 01 | 01 | - |
| (xvii) | ඔලිම්පියා ටයිප්රයිටරය | 01 | - | 01 |
| (xviii) | වතුර ෆිල්ටර් | 01 | 01 | - |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2017 මැයි 26 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 3.8 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 237(අ) | 445,462 | ැඩසටහන් යටතේ භාණ්ඩ මිලදී ගැනීම සඳහා විවිධ ආයතන වෙත චෙක්පත් 12 ක් නිකුත් කර තිබුණත්, 2017 පෙබරවාරි 28 දින වන විටත් අදාළ භාණ්ඩ කාර්යාලය වෙත සපයා නොතිබුණි |
| (ii) මුදල් රෙගුලාසි 342(5) | - | පාවිච්චි කරන ලද උපපත්‍රිකා පොත් වර්ෂ 5 ක් යන තෙක් රඳවා තබාගත යුතු වුවත්, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිකුත් කළ උපපත්‍රිකා පොත් 108 ක් නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාරදී නොතිබුණු අතර හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පාවිච්චි කළ උපපත්‍රිකා පොත් භාරගැනීමකින් තොරව නව කුවිතාන්සි පොත් නිකුත් කර තිබුණි. |
| **(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| 2015 මාර්තු 10 දිනැති 03/2014 (1) දරන චක්‍රලේඛය | 71,592 | රාජකාරී කාර්යාල දුරකථන වියදම් සීමාව ඉක්මවා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක දුරකථන බිල්පත් සඳහා ගෙවීම් කර තිබුණි. |

(ඇ) **රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ**

------------------------------

| | | |
|---|---|---|
| 2010 අගෝස්තු 25 දිනැති අංක CS/7/EX/1/38 දරන චක්‍රලේඛයේ 4(අ) 5 ජේදය | - | ආවරණ අනුමැතියට යටත්ව නිකුත් කළ පුපුරණ ද්‍රව්‍ය බලපත්‍රයක් සඳහා නිකුත් කළ යුත්තේ එක් සතියකට සාමාන්‍ය ඩෙටොනේටර්ස් 10 ක් නොඉක්මවන ප්‍රමාණයක් වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුපුරණ ද්‍රව්‍ය පාලක විසින් එම සීමාව ඉක්මවා 2015 ජනවාරි මාසයේ සිට 2016 වර්ෂයේ ජූනි මාසය දක්වා ඩෙටොනේටර්ස් 8880 ක් වැඩිපුර නිකුත් කර තිබුණි. |

(ඈ) **ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ**

------------------------------

| | | |
|---|---|---|
| 2015 නොවැම්බර් 26 දිනැති අංක MNPEA/PLN/DCB/2015 දරන චක්‍රලේඛයේ 1 හා 2 ජේද | 342,690 | ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී විමධ්‍යගත ප්‍රතිපාදන උපයෝගී කරගෙන සමෘද්ධි කාර්යාලවලට උපකරණ ලබාගෙන තිබුණි. |

(ඉ) **දේශීය ආදායම් කොමසාරිස්ගේ චක්‍රලේඛය**

--------------------------------------

| | | |
|---|---|---|
| 2014 අප්‍රේල් 03 දිනැති අංක CIR/UAT/2013/41 දරන චක්‍රලේඛය | 521,376 | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 06 ක් සඳහා අක්‍රීය ලියාපදිංචිකරුවෙකු වෙත එකතු කළ අගය මත බදු ගෙවීම් කර තිබුණි. |

(ඊ) **සුරාබදු කොමසාරිස්ගේ නිවේදන**

------------------------- --------

| | | |
|---|---|---|
| 2016 දෙසැම්බර් 22 දිනැති එල්බී/බලපත්‍ර/ පොදු/2016/02 දරන සුරාබදු නිවේදනය | 1,625,000 | සුරාබදු නිදහස් බලපත්‍ර මත 2017 වර්ෂය සඳහා තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් අයකළ යුතු බලපත්‍ර ගාස්තු හා මුද්දර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. |

3.9 **දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2016/2017 සංවර්ධන සැලැස්ම අනුව ඉටු කිරිමට සැලසුම් කළ ව්‍යාපෘති 509 කින් 496 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ගිරිතලේ ජලාශය ආශ්‍රිත පරිගණක දත්ත පද්ධතියක් සහිත ප්‍රජා ශාලාවක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. 1,990,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2017 ජනවාරි 25 දින වන විට රු. 1,937,269 ක් වැයකර තිබුණු අතර එදිනට එහි භෞතික ප්‍රගතිය සියයට 25 ක පමණ ප්‍රමාණයක් වාර්තා වී තිබුණි. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු යාබද පිහිටි සංචාරක හෝටලයක විරෝධතාවය මත නවතා තිබුණි.

(ii) මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රු. 102,000,000 ක් වැයකර ක්‍රියාත්මක කර තිබුණු ගැමිදිරිය ව්‍යාපෘතියේ ග්‍රාමීය සංවිධානවල ක්‍රියාකාරිත්වය පිළිබඳ අධීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. ඒ හේතුවෙන් වැයකළ රුපියල් 102,000,000 ක මුදලින් අපේක්ෂිත අරමුණු ඉටුවී ඇතිද යන්න තහවුරු නොවුණි.

(iii) ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන යටතේ ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු. 882,000 ක් වැයකර මැටි වළං හා විසිතුරු භාණ්ඩ නිෂ්පාදන කම්හලක් 2014 දෙසැම්බර් 26 දින ඉදිකර තිබුණි. 2016 දෙසැම්බර් 17 දින වන විටත් එහි මැටි වළං හා විසිතුරු භාණ්ඩ නිෂ්පාදනයක් සිදුකර නොතිබුණු අතර අදාළ කම්හල පිහිටි භූමියද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පවරාගෙන නොතිබුණි.

(iv) 2013 රජරට නවෝදය වැඩසටහන යටතේ ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ශක්‍යතා අධ්‍යයනයකින් තොරව රු.980,000 ක් වැයකර අත්තනකඩවල කහටපිටිය කොහු ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ඉදිකර තිබුණි. ඒ සඳහා විදුලිය ලබාගෙන නොතිබුණු අතර 2016 දෙසැම්බර් 31 දින වන විටත් නිෂ්පාදනයන් සිදු කර නොතිබුණි.

(v) 2013 සැප්තැම්බර් 30 දින සිට යහපාලනය සඳහා වූ දේශීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වූ E-Citizen වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණද 2016 දෙසැම්බර් 31 දින වන විට තොරතුරු පරිගණක ජාල ගත කර තිබුණේ දිස්ත්‍රික්කයේ ජනගහණයෙන් සියයට 5 ක පමණි.

**(ඇ) ව්‍යාපෘති ඉටු කිරිමේ ප්‍රමාදයන්**

පහත සඳහන් ව්‍යාපෘතිවල ප්‍රමාදයන් සිදුවී තිබුණි.

(i) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් වෙත කුකුල් පැටවුන් 8010 ක් රු. 2,563,200 කට මිලදී ගෙන තිබුණි. එම කුකුල් පැටවුන් 8010 කින් පැටව් 3310 ක් කාර්යාලය වෙත ලැබී නොතිබුණි. 2017 පෙබරවාරි 17 දින වන විට පැටව් 4700 ක් පමණක් බෙදා දී තිබුණු අතර, පරික්ෂා කරන ලද කුකුළු පැටව් 105ක නියැදියකින් පැටවුන් 46 ක් මියගොස් තිබුණු අතර පැටවුන් 59 ක් පමණක් ඉතිරිව පැවතුණි.

(ii) තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සේවා පියස 07 ක්, පෙර පාසල් 02 ක්, ක්‍රීඩාගාරයක්, දහම් පාසල් ගොඩනැගිලි 02 ක් හා මිතුරු සංසද ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. එම ගොඩනැගිලිවල සිදුකළ යුතු අත්‍යවශ්‍ය ඉදිකිරීම් ඉටු කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද භාවිතයට ගෙන නොතිබුණි.

**(ඇ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු. 71,868,082 ක් වැයකර අන්තර්බන්ධිත ගල් අතුරන ලද මාර්ග 77 ක් ඉදිකර තිබුණි. එම මාර්ග පිළිබඳව සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී මාර්ග 03 ක දෙපස කොන්ක්‍රීට් බිත්ති දැඩි ලෙස පුපුරා තිබුණු අතර තවත් මාර්ග 02 ක උරහිස් නිසිලෙස සකස් කර නොතිබුණි. එක් මාර්ගයක ජලය බැස යාමට කාණු පද්ධතියද සකස් කර නොතිබුණි.

(ii) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය දෙවන අදියර යටතේ ව්‍යාපෘති 59 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතිවල ප්‍රගතිය සියයට 100 ක් නිම කළ ලෙස දක්වා තිබුණද, මාර්ග 51 ක ප්‍රගතිය සියයට 40 ක සිට සියයට 95 ක් දක්වා පරාසයක පැවතුණි. මෙම ව්‍යාපෘතියේ මාර්ග 08 ක පමණක් අන්තර්බන්ධිත ගල් සම්බන්ධ තත්ත්ව වාර්තා ලබාගෙන තිබුණි. තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තත්ත්ව පාලන වාර්තා සැපයුම්කරු විසින්ම ඉදිරිපත් කරන ලද සාම්පල මත පදනම්ව ලබාගෙන තිබුණි.

(iii) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඇල්ලේවැව ක්‍රීඩාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ප්‍රකාරව ජනෙල්, විදුලි පංකා සවි කිරිම, විදුලි පරිපථ මීටරය සවිකිරිම, විදුලිය සැපයීම සඳහා Angal iron සවිකිරිම හා Earth wire සවි කිරිම සිදුකර නොතිබුණි .

(iv) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විමධ්‍යගත ප්‍රතිපාදන උපයෝජනය කර රු. 859,055 ක් වටිනා තහඩු හා ප්ලාස්ටික් පුටු තොගයක් මිලදී ගෙන තිබුණි. එම තහඩු හා ප්ලාස්ටික් පුටු 2017 පෙබරවාරි 17 දින වන විටත් ප්‍රතිලාභී සමිතිවලට බෙදාහැරීමකින් තොරව කාර්යාල පරිශ්‍රයේ රඳවාගෙන තිබුණි.

(v) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,000,000 ක ප්‍රතිපාදන උපයෝජනය කර ස්වයං රැකියාලාභීන්ට බෙදාදීම සඳහා මහන මැෂින් 34 ක් මිලදීගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ 05 දෙනෙකුගෙන් යුත් නියැදියක් පරීක්ෂා කිරීමේදී එම පස්දෙනා සඳහා ලබාදුන් මැෂින් යොදවා ස්වයං රැකියා ආරම්භ කර නොතිබුණි.

**(ඉ) භාණ්ඩ හා සේවා සැපයීමට පෙර මුදල් නිදහස් කිරීම**

---

දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කළුකැලේ පේෂකර්ම ගොඩනැගිල්ල නවීකරණය හා උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය සඳහා රු. 448,950 ක් වැයකර අත් යන්ත්‍ර පේෂකර්ම උපකරණ ලබාගැනීම සඳහා ගෙවීම් කර තිබුණි. නමුත් 2017 පෙබරවාරි 17 දින වන විටත් එම උපකරණ එම මධ්‍යස්ථානයට ලැබී නොතිබුණි.

**3.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**(අ) ගැලපුම් කලයුතු ශේෂ**

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රදේශීය ලේකම් කාර්යාල 07 ක් විසින් 2016 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණ ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | **ගැලැපුම් පිළිබඳ විස්තරය** | **කාල විශ්ලේෂණය**<br>**මාස 6 කට වැඩි වර්ෂ 01 කට අඩු** | **වර්ෂ 01 කට වැඩි වර්ෂ 3 කට අඩු** | **එකතුව** |
|---|---|---|---|---|
| | | **රු.** | **රු.** | **රු.** |
| (i) | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 775,692 | - | 775,692 |
| (ii) | හඳුනා නොගත් හර | 375 | 1,969 | 2,344 |
| | **එකතුව** | **776,067** | **1,969** | **778,036** |

**3.11 අවිධිමත් ගනුදෙනු**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු ඇතැම් ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැරවීම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පිබිදෙමු පොළොන්නරුව සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වාස්තු විද්‍යාඥ සේවාව ලබා ගැනීමට ලංසු කැඳවීමකින් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සේවා සපයන්නෙකු තෝරාගෙන තිබුණි. එම සේවාව ලබාගැනීම වෙනුවෙන් 2016 දෙසැම්බර් 26 දින රු. 4,660,011 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි.

(ii) මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන II අදියර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය 25 N අන්තර්බන්ධිත ගල් 525,000 ක් වැඩබිම් වෙත ප්‍රවාහනය කර බැම සඳහා රු.15,225,000 ක් වූ කොන්ත්‍රාත්තුව සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන තිබුණි. තෝරාගත් කොන්ත්‍රාත් ආයතනය ඉන් ඉවත්වී තිබුණද, එම ආයතනය අසාදු ලේඛනගත කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි. ඒ අනුව දෙවනුවට තෝරාගත් ආයතනයට අදාළ අන්තර්බන්ධිත ගල් සැපයීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණද අදාළ කොන්ත්‍රාත්කාර ආයතනය විසින් නියමිත පරිදි අන්තර්බන්ධිත ගල් සපයා

නොතිබුණි. මේ හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දින වන විට මාර්ග 35 කින් මාර්ග 12 ක පමණක් වැඩ අවසන් කර තිබුණි.

(iii) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2016 මාර්තු 02 දින ලංසු කැඳවා කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් නියමිත කාලය තුළ ඉදිකිරීම නිම කර නොතිබුණද රු. 672,665 ක් වූ ඔහුගේ කාර්යසාධන බැඳුම්කරය නිදහස් කර තිබුණි. ඒ අනුව ඉදිකිරීම් සඳහා නැවත වරක් ලංසු කැඳවා වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන තිබුණු නමුත් ව්‍යාපෘතිය නිම කළ යුතු දිනය 2016 දෙසැම්බර් 28 දින වුවද, 2017 මැයි 18 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණු අතර ඇළුමිනියම් වැඩ සඳහා රු.1,420,650 ක් නව කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද එම වැඩ විෂය ඉටුකර නොතිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3(ඇ) මාර්ගෝපදේශයට පටහැනිව ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහනට අදාළ ව්‍යාපෘති 17 ක් සඳහා අත්තිකාරම් සුරක්ෂණ ලබා නොගෙන කොන්ත්‍රාත්කරුවන් වෙත එකතුව රු.2,723,000 ක අත්තිකාරම් ගෙවා තිබුණි.

**(ආ) අධිකාරි බලය නොලත් ගනුදෙනු**

2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව අනුයුක්ත කළ වාහන හිමිකම ඇති නිලධාරීන්ට සංචිත වාහන භාවිතා කළ නොහැකි වුවද, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් විසින් දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොගෙන සංචිත වාහනයක් සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 25 කදී භාවිතා කර තිබුණි.

## 3.12 අනාර්ථික ගනුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ශබ්ද විකාශන යන්ත්‍ර පැවතියද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදු කරන ලද විවිධ උත්සව අවස්ථා 05 ක් සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට ගෙන ඒ සඳහා රු.360,000 ක් වැයකර තිබුණි.

(ආ) හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ දෙවන අදියරේ මාර්ග සඳහා අන්තර් බන්ධිත ගල් මිලදී ගැනීම වෙනුවෙන් අවම ලංසු ඉදිරිපත් කළ සැපයුම්කරුවන් දෙදෙනා පසුව ඉවත් වී තිබුණි. නමුත් එම සැපයුම්කරුවන් දෙදෙනා අසාදුගත කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව තෙවන අවම ලංසුව ඉදිරිපත් කළ සැපයුම්කරු තෝරාගෙන තිබුණි. එම සැපයුම්කරු විසින් සපයා තිබුණු අන්තර් බන්ධිත ගල් අතරින් අහඹු ලෙස තෝරාගත් ගල් 5 ක් තත්ත්ව පාලන පරීක්ෂාව සඳහා යොමු කළ අතර එයින් ගල් 4 ක එනම් සියයට 80 ක අවශ්‍ය නිවුටන් බලය නොතිබුණි.

(ඇ) මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිරිසිදු කිරීම හා එහි භූමි අලංකරණය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.567,785 ක් වැයකර තිබුණි. නමුත් සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී මදුරුවන් බෝවී තිබූ ස්ථාන රාශියක් පැවතුණි. සනීපාරක්ෂක කම්කරුවන්ගේ දෛනික පැමිණීම හා පිටවීම සටහන් කරවාගෙන නොතිබුණු අතර විධිමත් හා වගකීම් සහිත පිරිසිදු කිරීමේ සේවාවක් සැපයීම සඳහා පිරිසිදු කිරීම් කටයුතු සැලැසුම් කර නොතිබුණි.

**3.13 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, දිඹුලාගල හා ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විවිධ ගෙවීම් සඳහා 2016 දෙසැම්බර් 31 දිනට පෙර ලියන ලද එකතුව රු. 7,493,178 ක් වටිනා චෙක්පත් 33 ක් 2017 පෙබරවාරි 28 දින වන විටත් අත රඳවාගෙන තිබුණි.

**3.14 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කැබ් රථයක් 2013 ඔක්තෝබර් 31 දින හා තවත් කැබ් රථයක් 2014 ජුනි 22 දින අනතුරුවලට භාජනය වී තිබුණි. එම අනතුරුවලින් සිදු වූ අලාභය සඳහා රක්ෂණ ආයතනයෙන් අදාළ ප්‍රතිපූර්ණය කර ගත යුතුව තිබුණු රු.173,492 ක් අයකර ගැනීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2017 මාර්තු 31 දින වන විටත් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ් රථයක් 2011 ජූලි 25 දින අනතුරකට පත්වීමෙන් සිදු වූ රු.230,000 ක අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරියාගෙන් අයකළ යුතු බව ඒ සඳහා පත්කළ පරීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කර තිබුණි. එය අයකර ගැනීමට 2017 මාර්තු 31 දින වන විටත් කිසිදු පියවරක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙන නොතිබුණි. අනතුරු සිදුවී වසර 6 කටත් වඩා වැඩි කාලයක් ගතවී තිබුණද, එම කැබ් රථය කිසිදු අලුත්වැඩියා කිරීමකින් තොරව ආවරණයක් රහිතව දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේ දිරාපත් වෙමින් පැවතුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනතුරට පත්වූ කැබ් රථයක් සම්බන්ධයෙන් 2014 අගෝස්තු 15 දින සිදු කරන ලද පරීක්ෂණ වාර්තාවේ නිර්දේශය ප්‍රකාරව රු.149,450 ක අලාභය රියදුරුගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණි. නමුත් විගණන දිනය වූ 2017 මාර්තු 31 දින වන විටත්, එම අලාභය රියදුරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කැබ් රථයක් 2005 පෙබරවාරි 09 දින අනතුරකට ලක් වීමෙන් රු.349,495 ක අලාභයක් සිදුවී තිබුණි. එම රථය ගැටුණු අනෙක් වාහනයේ හිමිකරු රු.100,000 ක මුදලක් ගෙවීමට එකඟ වී තිබුණත් එය ලබා ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් කටයුතු කර නොතිබුණි. එසේ රජයට අයකළ යුතු අලාභය අයකර නොගැනීම සම්බන්ධයෙන් ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) 2014 මැයි 12 දින සොරුන් විසින් රැගෙන ගිය පරිගණක යන්ත්‍රය පිළිබඳ ප්‍රාරම්භක වාර්තාවක් දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් විසින් 2015 ජූලි 06 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබුණි. 2016 අප්‍රේල් 25 දින සිහිකැඳවීමේ ලිපියක් යවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඊ) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු වතුර බවුසරය සඳහා ලීටර් 7,500 ක නව ටැංකියක් සවිකිරීමට රු.1,485,000 ක් වැයකර තිබුණි. සවිකර තිබුණු ටැංකියේ ධාරිතාවය ලීටර් 5970 ක් වුවත්, අඩු ධාරිතාවයක් සහිත ටැංකියක් එම මිලට සවිකිරීම සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් සමාලෝචිත වර්ෂයේදී ගෙන නොතිබුණි. තවද ඉවත් කරන ලද ටැංකියද ආපසු භාරදී නොතිබුණි.

(උ) 2014/2015 මහ කන්නයේ මිලදී ගත් වී දීර්ඝ කාලයක් මුළුල්ලේ ගබඩාවේ රඳවා තිබීම නිසා වියළීමට ලක්වීම හා ගත් මිලට වඩා අඩු අගයකට අලෙවි කිරීම නිසා රු. 104,095,109 ක අලාභයක් සිදුවී තිබුණි.

## 3.15 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකාපුර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පදිංචිකාරයන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුට විදේශගත වීම සඳහා පදිංචිය සහතික කිරීමට කූඨ ලේඛන සකස් කර ලබාදීම වෙනුවෙන් ග්‍රාම නිලධාරීන් සිව්දෙනෙකු 2016 මැයි 25 දින අත් අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර තිබුණි. 2016 නොවැම්බර් 08 දිනැති අංක HAF-3 DICIP/02-021-iv දරන ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ ලිපිය මගින් ලඝු විනය කටයුතු කිරීම සඳහා සකස් කරන ලද චෝදනා පත්‍ර කෙටුම්පත් කර එවා තිබුණද, 2017 අප්‍රේල් 03 දින වන විටත් චෝදනා පත්‍ර භාරදී ලඝු විනය පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ආ) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන ග්‍රාම නිලධාරී තනතුරට පත් කිරීම සඳහා නිර්දේශ වූ ග්‍රාම නිලධාරිනියක් කාන්තාවක්වීම හේතුවෙන් එම තනතුරට පත් නොකර ජ්‍යෙෂ්ඨත්වයෙන් අඩු ග්‍රාම නිලධාරීවරයෙකු පත් කර තිබුණි.

(ඇ) 2016 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද කිරි වීදුරුව වැඩසටහන සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් එකතුව රු.1,605,378 ක් ඉතිරි කර තිබුණි. තමන්කඩුව, ඇලහැර, දිඹුලාගල හා ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පිහිටි පෙර පාසල් 219 කින් 51 ක පමණක් මෙම කිරි වීදුරුව වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 23 දින වන විට 2014 - 2016 කාලපරිච්ඡේදය තුළ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඉඩම් බලපත්‍ර ඉල්ලුම් කර තිබුණු ප්‍රමාණය 485 ක් වී තිබුණි. නමුත් බලපත්‍ර 135 ක් පමණක් ලබාදී තිබුණි. බලපත්‍ර ඉල්ලුම්කරුවන් වෙත ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ හා රජයේ ඉඩම් පනත යටතේ කිසිදු බලපත්‍රයක් හෝ දීමනා පත්‍රයක් ලබාදී නොතිබුණි.

(ඉ) මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාසයක පදිංචිව සිටි නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.153,600 ක හිඟ නිවාස කුලිය අයකර නොතිබුණි.

(ඊ) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ස්වේච්ඡා සංවිධානවලට බෙදාදීම සඳහා 2016 වර්ෂයේ රු. 314,719 ක් වැයකර මිලදී ගෙන තිබුණු භාණ්ඩ අදාළ සංවිධාන වෙත නිකුත් කිරීමෙන් තොරව 2017 පෙබරවාරි 28 දින වන විටත් ගබඩාවේ නිෂ්ක්‍රීයව පැවතුණි.

(උ) වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ස්වයංරැකියා ආධාර ලබාදීම සඳහා රු. 289,084 ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබුණි. අදාළ පාර්ශවයන් වෙත එම භාණ්ඩ ලබාදීමෙන් තොරව 2017 පෙබරවාරි 28 දින වන විටත් ඒවා ගබඩාවේ පැවතුණි.

(ඌ) 2000 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලය තුළ පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් විසින් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත සපයන ලද සහල් වෙනුවෙන් රු. 42,127,825 ක් ලැබිය යුතුව තිබුණි. 2017 මාර්තු 31 දින වන විටත් එම මුදල් ලබාගැනීමට අපොහොසත් වී තිබුණි.

(එ) විජයබාහුපුර ආර්.බී. 07 අපවහන ජල මාර්ගය ප්‍රතිසංස්කරණ කිරීමේ ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යනයකින් තොරව රු.750,000 ක ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.748,250 ක් වැයකර තිබුණි. ඇල මාර්ගය ආරම්භයේදී කිලෝ මීටර් 1.5 ක් ප්‍රතිසංස්කරණය කර නොතිබුණු බැවින් එම කොටසෙහි ගංවතුර අවධානම එලෙසම පැවතුණි.

(ඒ) යලි පිබිදෙමු ව්‍යාපෘතිය යටතේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ස්වේච්ඡා සංවිධාන 04 කට රු.2,575,000 ක ණය ලබාදී තිබුණි. එම සමිති සක්‍රියව ක්‍රියාත්මක නොවුණු අතර ණය අයකර ගැනිම අසතුටුදායක තත්ත්වයක පැවතුණි.

(ඔ) 2015 මාර්තු 17 දින ස්ථාන මාරු වී ගිය දිඹුලාගල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් භාවිතා කළ ලැප්ටොප් පරිගණකය, චාර්ජරය හා බෑගය, C.D.M.A දුරකථනය හා යතුරු පුවරුව ආපසු භාරදී නොතිබුණි. නමුත් එය භාර නොදීම සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගෙන නොතිබුණි.

(ඕ) මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලියාපදිංචි කර නොතිබුණු ස්වේච්ඡා සංවිධාන 2 ක් වෙත විමධ්‍යගත අරමුදල් යටතේ රු.117,000 ක් වටිනා භාණ්ඩ ලබාදී තිබුණි.

(ක) තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ඉඩම් බලපත්‍ර 54 ක් හා දීමනා පත්‍ර 13 ක් ප්‍රතිලාභීන් වෙත ලබා නොදී කාර්යාලයේ රඳවා තබාගෙන තිබුණි. 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ ප්‍රතිලාභීන් 2234 දෙනෙකු බලපත්‍ර අයදුම්කර තිබුණු නමුත් ඉන් අනුමත කළ බලපත්‍ර 495 කින් බලපත්‍ර 282 ක් සකස් කර නොතිබුණි. දීමනාපත්‍ර ලබාගැනීමට 2014, 2015 හා 2016 යන වර්ෂවල ලද අයදුම්පත් 246 ක් පමණ මූලික අදියරේ පැවතුණි.

(ග ) තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ හැඳුනුම්පත් නොමැති පුද්ගලයින් පිළිබඳ විධිමත් ඇස්තමේන්තුවක් ලබාගෙන නොතිබුණි. 2016 ජූලි මාසයේ පැවැත්වූ ජංගම සේවය මඟින් ප්‍රතිලාභීන් 1393 දෙනෙකුගේ තොරතුරු වාර්තා භාරගෙන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත යවා තිබුණද, 2017 මාර්තු 08 දින වන විටත් හැඳුනුම්පත් ලැබී නොතිබුණි.

(ච ) තමන්කඩුව හා දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 90 කට අදාළව රු.155,133,313 ක් වූ බිල්පත්, 2017 මාර්තු 08 දින හා 2017 පෙබරවාරි 20 දින වන විටත් නිරවුල් නොකර අත රඳවා තබාගෙන තිබුණි.

(ජ) පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිදු වූ වාහන අනතුරු 19 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 හා 109 අනුව කටයුතු කිරීම වර්ෂ 01 ක සිට වර්ෂ 10 ක අතර පරාසයක කාලයක් ප්‍රමාද කර තිබුණි.

(ට) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළ වාහන අනතුරු 06 ක් සම්බන්ධයෙන් අවසන් පරීක්ෂණ වාර්තා ලබාදීමට සමීක්ෂණ මණ්ඩල පත් කර වර්ෂ 03 කට අධික කාලයක් ඉක්මවා තිබුණද, 2017 මාර්තු 31 දින වන විටත් වාර්තා ලබාදී නොතිබුණි.

**3.16** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-----------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සේවක සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| | ---------------- | -------------- | ------------- | ---------------- |
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 41 | 34 | 7 |
| (ii) | තෘතියික මට්ටම | 29 | 21 | 8 |
| (iii) | ද්විතීයික මට්ටම | 978 | 723 | 255 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 94 | 84 | 10 |
| | | ------ | ------ | ------ |
| | **එකතුව** | **1,142** | **862** | **280** |
| | | ==== | === | === |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා අනුමත ප්‍රාදේශීය ලේකම් තනතුරු සංඛ්‍යාව 07 ක් වූ අතර ඉන් 04 ක් සඳහා ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.2 වගන්තියට පටහැනිව වර්ෂයකට අධික කාලයක සිට වැඩ බැලීමේ පත්වීම් ලබාදී තිබුණි.

(ආ) සාමාන්‍ය වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුව මාරුවීම් ලබා නොදී නිලධාරීන් 17 දෙනෙක් වර්ෂ 5 කට අධික සේවා කාලයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවයේ යොදවා තිබුණි.

(ඇ) හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අනුයුක්ත කර තිබුණු ආර්ථික සංවර්ධන නිලධාරීන් වෙත සමාලෝචිත වර්ෂයේදී ලිඛිතව රාජකාරි පවරාදී නොතිබුණි.